2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.	2021 රු.
වෙළඳ ආදායම	**11,039,292.18**	**7,125,392.83**
අඩුකළා:විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	877,829.84	1,162,902.76
මිලදී ගැනීම්	9,507,589.25	5,045,419.75
තොග හානි	-	-
අවසාන තොගය	(2,476,027.52)	(877,829.84)
	7,909,391.57	5,330,492.67
දළ ලාභය/අලාභය	**3,129,900.61**	**1,794,900.16**
පොදු කාර්ය පිරිවැය	2,032,919.28	2,308,106.53
ශුද්ධ ලාභය/අලාභය	**1,096,981.33**	**(513,206.37)**

2.2 දෙනිවල ඇග්‍රෝ ෆ්‍රෙෂ් අලෙවිසැල
2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.	2021 රු.
වෙළඳ ආදායම	38,876,238.23	9,526,904.25
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	1,439,604.31	-
මිලදී ගැනීම්	40,253,920.00	10,155,351.42
ප්‍රවාහන	-	-
අවසාන තොගය	(5,204,603.71)	(1,439,604.31)
	34,488,920.60	8,715,747.11
දළ ලාභය/අලාභය	**2,387,317.63**	**811,157.14**
පොදු කාර්ය පිරිවැය	6,273,103.94	2,894,613.49
ශුද්ධ ලාභය/අලාභය	**(3,885,786.31)**	**(2,083,456.35)**

2.3

පැල අලෙවි සැල - දෙහිවල

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.	2021 රු.
වෙළඳ ආදායම (පැළ සහ පොහොර)	**7,550,425.00**	**4,703,827.00**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	1,127,757.16	797,826.18
මිලදී ගැනීම්	6,589,588.25	3,616,512.50
තොග හානි	-	-
අවසාන තොගය	(1,735,462.80)	(1,127,757.16)
	5,981,882.61	3,286,581.52
දළ ලාභය/අලාභය	**1,568,542.39**	**1,417,245.48**
පොදු කාර්ය පිරිවැය	(1,840,917.14)	(1,381,990.12)
ශුද්ධ ලාභය/අලාභය	**(272,374.75)**	**35,255.36**

2.4 සහල් පිටි ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.	2021 රු.
ආරම්භක තොගය	634,074..50	-
මිලදී ගැනීම්	1,015,532.50	-
තොග හානි	-	-
අවසාන තොගය -අමුද්‍රව්‍ය	(1,486,339.50)	-
අමු ද්‍රව්‍ය පිරිවැය	163,267.50	-
ආරම්භක තොගය-නොනිමි වැඩ	-	-
තොග හානි	-	-
අවසාන තොගය-නොනිමි වැඩ	-	-
නිෂ්පාදන පිරිවැය	163,267.50	-
විකුණුම් ආදායම	**500,171.40**	**-**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	163,267.50	24,580.00
නිෂ්පාදන වියදම	-	-
	163,267.50	24,580.00
තොග හානි	-	-
අවසාන තොගය	-	-
	163,267.50	24,580.00
දළ ලාභය/අලාභය	**336,903.90**	**(24,580.00)**
පොදු කාර්ය පිරිවැය	27,650.00	-
ශුද්ධ ලාභය/අලාභය	**(309,253.90)**	**(24,580.00)**

2.5 කොම්පොස්ට් ව්‍යාපෘතිය -බුත්තල

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.	2021 රු.
ආරම්භක තොගය	663,545.75	227,450.55
මිලදී ගැනීම්	1,787,160.00	2,319,900.00
සෘජු වැටුප්		
ප්‍රවාහන		
අවසාන තොගය- අමු ද්‍රව්‍ය	(180,200.00)	(663,545.75)
	2,270,505.75	1,883,804.80
ආරම්භක තොගය-නොනිමි වැඩ		
අවසාන තොගය-නොනිමි වැඩ		
නිෂ්පාදන වියදම	2,270,505.75	1,883,804.80
වෙළඳ ආදායම	**2,797,954.00**	**2,264,740.00**
<u>අඩු කලා</u>: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	-	-
නිෂ්පාදන වියදම	2,270,505.75	1,883,804.80
අවසාන තොගය		
	2,270,505.75	**1,883,804.80**
දළ ලාභය/ අලාභය	**527,448.25**	**380,935.20**
පොදු කාර්ය පිරිවැය	(692,000.00)	(288,000.00)
ශුද්ධ ලාභය/අලාභය	**(164,551.75)**	**92,935.20**

2.6 පාරම්පරික සහල් ව්‍යාපෘතිය

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.	2021 රු.
ආරම්භක තොගය	107,790.01	567,930.97
මිලදී ගැනීම්	3,134,219.00	623,875.00
ප්‍රවාහන	-	-
ඇඹරුම් පිරිවැය	-	-
සෘජු වැටුප්	-	-
තොග හානි	-	-
අවසාන තොගය	(1,583,612.99)	(107,790.01)
	1,658,396.02	1,084,015.96
ආරම්භක තොගය-නොනිමි වැඩ	-	-
තොග හානි	-	-
අවසාන තොගය-නොනිමි වැඩ	-	-
නිෂ්පාදන වියදම	1,658,396.02	1,084,015.96
වෙළඳ ආදායම	**1,808,975.00**	**2,322,210.70**
අඩුකලා:විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	74,091.10	1,029,411.69
නිෂ්පාදන වියදම	1,658,396.02	1,084,015.96
	1,732,487.12	2,113,427.65
තොග හානි	-	(400.00)
අවසාන තොගය	-	(73,691.10)
	1,732,487.12	2,039,336.55
දළ ලාභය/අලාභය	**76,487.88**	**282,874.15**
පොදු කාර්ය පිරිවැය	(3,689,336.69)	(2,641,123.94)
ශුද්ධ ලාභය/අලාභය	**(3,612,848.81)**	**(2,358,249.79)**

2.7 බුත්තල ගොවිපල

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.	2021 රු.
ආරම්භක තොගය	-	-
මිලදී ගැනීම්	**3,560.00**	**781,022.00**
අවසාන තොගය- අමු ද්‍රව්‍ය	-	-
	3,560.00	781,022.00
ආරම්භක තොගය-නොනිමි වැඩ	-	-
අවසාන තොගය-නොනිමි වැඩ	(119,700.00)	-
නිෂ්පාදන වියදම	(116,140.00)	-
වෙළඳ ආදායම	**72,380.00**	**78,880.00**
<u>අඩු කලා</u>:විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	-	-
නිෂ්පාදන වියදම	(116,140.00)	781,022.00
අවසාන තොගය	-	-
	-	**-**
	(116,140.00)	**781,022.00**
දළ ලාභය/අලාභය	**188,520.00**	**(702,142.00)**
පොදු කාර්ය පිරිවැය	1,863,652.71	1,868,500.93
ශුද්ධ ලාභය/අලාභය	**(1,675,132.71)**	**(2,570,642.93)**

2.8 තණමල්විල ගොවිපල

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.	2021 රු.
ගොවිපල ආදායම	**-**	**-**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොග		
නිෂ්පාදනවියදම	-	5,830.00
අවසාන තොග	-	-
	-	**5,830.00**
දළ ලාභය/අලාභය	**-**	**(5,830.00)**
පොදු කාර්ය පිරිවැය	(1,099,976.76)	(868,826.55)
ශුද්ධ ලාභය/අලාභය	**(1,099,976.76)**	**(874,656.55)**

2.9 එළවළු ව්‍යාපෘතිය

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.	2021 රු.
වෙළඳ ආදායම	**254,370.00**	**-**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොග	254,370.00	254,370.00
මිලදී ගැනීම්	-	-
ඇසුරුම් කිරීම	-	-
තොග සැකසුම් ගාස්තු	-	-
ධූමකරණ වියදම		
තොග හානි		
අවසාන තොග	-	(254,370.00)
	254,370.00	**-**
දළ ලාභය/අලාභය	**-**	**-**
පොදු කාර්ය පිරිවැය	-	-
ශුද්ධ ලාභය/අලාභය	**-**	**-**

2.10 ඉදිආප්ප පිටි ව්‍යාපෘතිය

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.	2021 රු.
වෙළඳ ආදායම	**490,181.76**	**65,952.00**
අඩුකලා:විකුණුම් පිරිවැය		
ආරම්භක තොග	-	-
මිලදී ගැනීම්	2,481,325.00	-
ඇසුරුම් කිරීම	-	-
තොග හානි	-	-
අවසාන තොග	(2,069,375.00)	-
	411,950.00	**-**
දළ ලාභය/අලාභය	**78,231.76**	**65,952.00**
පොදු කාර්ය පිරිවැය	736,485.00	40,588.00
ශුද්ධ ලාභය/අලාභය	**(658,253.24)**	**25,364.00**

2.11 වත්තල අලෙවිසැල

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.
වෙළඳ ආදායම	**3,110,046.59**
අඩුකලා: විකුණුම් පිරිවැය	
ආරම්භක තොග	-
මිලදී ගැනීම්	3,733,146.56
තොග හානි	
අවසානතොග	(1,105,640.75)
	2,627,505.81
දළ ලාභය/අලාභය	**482,540.78**
පොදු කාර්ය පිරිවැය	1,418,580.34
ශුද්ධ ලාභය/අලාභය	**(936,039.56)**

2.12 බුත්තල ගොවි පියස

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.
වෙළඳ ආදායම	**9,948,010.00**
අඩුකලා: විකුණුම් පිරිවැය	
ආරම්භක තොග	-
මිලදී ගැනීම්	9,088,500.00
තොග හානි	
අවසාන තොග	-
	9,088,500.00
දළ ලාභය/අලාභය	**859,510.00**
ශුද්ධ ලාභය/අලාභය	**859,510.00**

2.13 පලතුරු බීම ව්‍යාපෘතිය

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.
ආරම්භක තොගය	-
මිලදී ගැනීම්	157,727.42
ආරම්භක තොගය- අමු ද්‍රව්‍ය	-
අවසාන තොගය- අමු ද්‍රව්‍ය	(17,451.50)
	140,275.92
ආරම්භක තොගය-නොනිමි වැඩ	-
අවසාන තොගය-නොනිමි වැඩ	-
නිෂ්පාදන වියදම	140,275.92
වෙළඳ ආදායම	**266,992.20**
අඩුකලා:විකුණුම් පිරිවැය	
ආරම්භක තොගය	-

නිෂ්පාදන වියදම	140,275.92
අවසාන තොගය	-
දළ ලාභය/අලාභය	**126,716.28**
පොදු කාර්ය පිරිවැය	333,262.50
ශුද්ධලාභය/අලාභය	**(206,546.22)**

2.14

බඩඉරිගු ව්‍යාපෘතිය

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2022 රු.
වෙළඳ ආදායම	**88,842,687.50**
අඩුකලා: විකුණුම් පිරිවැය	
ආරම්භක තොග	-
මිලදී ගැනීම්	87,827,342.50
තොග හානි	
අවසානතොග	-
	87,827,342.50
දළ ලාභය/අලාභය	**1,015,345.00**
පොදු කාර්ය පිරිවැය	160,005.00
ශුද්ධලාභය/අලාභය	**855,340.00**

වෙළඳ ලාභ /අලාභගිණුම්

ව්‍යාපෘතිය	2022		2021	
	දළ ලාභය/ (අලාභය)	ශුද්ධ ලාභය /(අලාභය)	දළ ලාභය/ (අලාභය)	ශුද්ධ ලාභය/ (අලාභය)
	රු.	රු.	රු.	රු.
දෙහිවල අලෙවිසැල	2,387,317.63	(3,885,786.31)	811,157.14	(2,083,456.35)
පැල අලෙවි සැල - නාරාහේන්පිට	3,129,900.61	1,096,981.33	1,794,900.16	(513,206.37)
පැල අලෙවි සැල -දෙහිවල	1,568,542.39	(272,374.75)	1,417,245.48	35,255.36
බුත්තල කොම්පොස්ට්	527,448.25	(164,551.75)	380,935.20	92,935.20
පාරම්පරික සහල් ව්‍යාපෘතිය	76,487.88	(3,612,848.81)	282,874.15	(2,358,249.79)
බුත්තල ගොවිපල	188,520.00	(1,675,132.71)	(702,142.00)	(2,570,642.93)
තණමල්විල ගොවිපල	-	(1,099,976.76)	(5,830.00)	(874,656.55)
ඉදිආප්ප පිටි ව්‍යාපෘතිය	78,231.76	(658,253.24)	65,952.00	25,364.00
වත්තල අලෙවිසැල	482,540.78	(936,039.56)	-	-
බුත්තල ගොවි පියස	859,510.00	859,510.00	-	-
පලතුරු බීම ව්‍යාපෘතිය	126,716.28	(206,546.22)	-	-
බඩඉරිඟු (ආනයන) ව්‍යාපෘතිය	1,015,345.00	855,340.00	-	-
සහල් පිටි තෝසේ පිටි ව්‍යාපෘතිය	336,903.90	309,253.90	(24,580.00)	(24,580.00)
එකතුව	**10,777,464.48**	**(9,390,424.88)**	**4,020,512.13**	**(8,271,237.43)**

3. සෘජු සංවර්ධන වියදම් ආධාර මුදල් යටතේ දක්වා ඇත.

4. ප්‍රධාන කාර්යාලයේ පරිපාලනය සඳහා දැරූ වියදම් වලින් කොටසක් භාණ්ඩාගාර අරමුදල් යටතේ දරා ඇත.

භාණ්ඩාගාර අරමුදල්

විස්තරය	අයවැය ප්‍රතිපාදන	2022 සත්‍ය වියදම්	2022 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන	ඉතිරිය / ඌනතාවය
පුනරාවර්ථන	50,000,000.00	57,254,442.72	46,800,000.00	3,200,000.00
ප්‍රාග්ධන	5,000,000.00	-	-	5,000,000.00
එකතුව			**46,800,000.00**	

5. අම්බලන්තොට වැටේ නඩුවට අදාළව රුපියල් 6,331,223.50 ක මුදලක් ගෙවීමට දිසා අධිකරණය නියෝග කළේය. (ප්‍රකාශිත මුදල රු. 3,206,321.44ල නීතිමය පොලී රු. 2,889,152.06ල නඩු ගාස්තු රු. 235,750.00) කෙසේ වෙතත් දිසා අධිකරණයේ තීන්දුවට එරෙහිව මණ්ඩලය විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. මෙම මුදල අවිනිශ්චිත වගකීම් ලෙස පෙන්වයි.

6. කුඩා වැව් සංවර්ධන ව්‍යාපෘතියෙන්ලද 81,134,631.80 මුදල පහත ආකාරයට 2017 සහ 2018 වර්ෂයන්හි, වැය පහත දැක්වෙන ආකාරයට තැන්පතු වලින් අඩු කොට දක්වා ඇත.


ආපසු ගෙවිය යුතු තැන්පතු	රු. 81,134,631.80
2017 වර්ෂයේ වැය වූ වියදම්	රු. (1,445,668.16)
2018 වර්ෂයේ වැය වූ වියදම්	රු. (1,924,927.39)
	රු, **77,764,036.25**

7. සෝයා තොගය අස්ථානගතවීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මගින් පරීක්ෂණ සිදුකෙරේ. මෙය නීතිපති දෙපාර්තමේන්තුවටත් දන්වා ඇත.
8. සහල් ව්‍යාපෘතිය යටතේ ගබඩා කර තිබූ සාවස්තිපුර ගබඩාවේ සහල් තොගයේ හිඟයක් පවතින බවට අනුරාධපුර පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ.
9.
   - 2021 වර්ෂයේ බුත්තල කොම්පෝස්ට් අංගනය සකස් කිරීම සඳහා BOQ සැලසුම් ගාස්තු (රු. 111,487.08) ගෙවීම ප්‍රාග්ධන වියදම් ලෙස ගෙන ඇත. කොම්පෝස්ට් අංගනය පසුගිය වසරේ ඉදි නොකළ නිසා මේ වසරේ වියදමක් ලෙස ගෙන ඇත. එය සමුච්චිත අරමුදලට ගැලපේ.
   - 2021 වර්ෂයට අදාළව 2022 දී ගෙවන ලද අතිකාල (රු. 74,585.02) 2021 දී වෙන් නොකිරීමේ නිවැරදි කිරීම මෙම වසරේ සමුච්චිත අරමුදල යටතේ සිදු කර ඇත.

- අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අංක 2022/415/2960 යටතේ 2013 වර්ෂයේ පැල තවාන සිදුවූ මුදල් වංචාව සම්බන්ධයෙන් සිදුකළ මූලික විමර්ශනයෙන් අනතුරුව යසන්ති සෙනවිරත්න මෙනවියගෙන් මුදල් අයකර ගන්නා ලෙස දැනුම් දෙන ලදී. ඒ අනුව ඇයගේ පාරිතෝෂික මුදලින් රුපියල් 77,362.00 අයකර ගන්නා ලද අතර එය සමුච්චිත අරමුදලට ගලපා ඇත.
- 2021 වර්ෂයට අදාළව, ස්ථාවර තැන්පතු ගිණුම් අංක 83233121 සහ 81125561 සඳහා ලැබිය යුතු ආදායමේ අතිරික්ත වෙන්කිරීම් නිවැරදි කිරීම සමුච්චිත අරමුදලට ගලපා ඇත.
- 2021 ප්‍රයෝජනවත් ආයු කාලය තීරණය කර නොමැති බැවින් නළ ළිඳ ක්ෂය වී නොමැත. මෙම වසර සඳහා නළ ළිදෙහි ප්‍රයෝජනවත් ආයු කාලය තීරණය කර ඇති අතර 2021 වර්ෂය සඳහා ක්ෂයවීම ලෙස රුපියල් 37,650.52 ක මුදල සමුච්චිත අරමුදලට ගලපා ඇත.
- රු. 15,623.75 ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් යටතේ මිලදී ගත් වෙළඳසැල් රාක්කය ක්ෂය වීම 2021 වර්ෂයේ වැඩිපුර ක්ෂය වී ඇති අතර මෙම මුදල නිවැරදි කිරීම සඳහා සමුච්චිත අරමුදලට ගලපන ලදී.
- 2020 වර්ෂයේ වෙන් කරන ලද විගණන ගාස්තු රුපියල් 770,000.00 ක් වූ අතර සත්‍ය පිරිවැය රුපියල් 720,000.00 කි. ඒ අනුව උපචිත වියදම්වලින් වැඩිපුර වෙන් කරන ලද ප්‍රතිපාදන ඉවත් කිරීම සමුච්චිත අරමුදලට ගලපා ඇත.
- 2021 වසර සඳහා වෙන් කර ඇති රුපියල් 108,000.00 අඩු විගණන ගාස්තු වෙන් කිරීම මෙම වසරේ සමුච්චිත අරමුදලට ගලපා ඇත.
- සහල් පිටි සහ තෝසේ පිටි ව්‍යාපෘතියට අදාළව 2021.12.31 දිනට තොගය ගෙන නොමැති බැවින් මෙම වසරේ නිවැරදි කිරීම අරමුදල් ශේෂයට ගලපා ඇත.

10. 691,211.68 ක මුදල සම්බන්ධයෙන් විමර්ශන කණ්ඩායම FR.104 විමර්ශනය අවසන් කර ඇති අතර වාර්තාව ලැබීමට නියමිතය. (වෙළඳ ණයගැතියන්)
11. බුත්තල සහ තණමල්විල ඉඩම් වසර තිහක දිගුකාලීන බදු පදනම මත පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එකඟතාවය මත ඌව පළාත් සභාවේ නිර්දේශය මත අදාළ ලේඛනය ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. බුත්තල ගොවිපළේ අලි වැටක් සහ නළ ළිඳක් ද ඉදිකර තිබේ.
12. තණමල්විල වැව 2021 වසර සඳහා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. 500,000.00 ස්ථාවර වත්කම් ලෙස ගෙන ඇත. එය අත්තිකාරමක් ලෙස ගත යුතු අතර එය 2022 වර්ෂය තුළ නිවැරදි කරන ලදී.

2022 විගණන වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


FEHC BOARD
24 MAY 2023
6392

2023 මැයි 19 දින.

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් මෙහෙයීම සහ නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

ඒ.ඩබ්ලිව්.එච්.සී. විජේරත්න
විගණකාධිපති

පිටපත් :- 1. ලේකම්, කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය.
2. ලේකම්, මූල්‍ය, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ඒආර්අයි/බී/එච්සිබී/එස්ජේ/01/22/182 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023 මැයි 19 දින

සභාපති
ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශණය සහ මූල්‍ය ප්‍රකාශණ වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2. මතය සඳහා පදනම

(අ) මණ්ඩලයේ වත්කම් අපහරණයෙන් ලද රු. 286,775 ක් වෙනුවට මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එම වත්කම්වල පිරිවැය වූ රු.737,477 ක් දක්වා තිබීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ජනනය වූ මුදල් ප්‍රවාහය රු. 450,702 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මණ්ඩලයේ දෙහිවල පැළ අලෙවිසැලේ රු. 81,960 ක පැළ විනාශ වී ඇතත් එම වටිනාකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් නොකිරීම නිසා ලාභය හා අවසන් නොගයේ අගය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් කොළඹ ප්‍රදේශයේ බිස්කට් නිෂ්පාදනය කරන පුද්ගලික සමාගමක් හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය සමඟ බඩඉරිඟු වගාකර සැපයීමේ ව්‍යාපෘති ගිවිසුමකට එළඹී එම ගිවිසුම් ප්‍රකාරව පෞද්ගලික සමාගම රු. 18,000,000 ක මූල්‍ය දායකත්වයක්ද, කාර්යාංශය විසින් ශ්‍රම සැපයීම් මත මෙම නිෂ්පාදන කාර්යයන් ආරම්භ කර තිබුණි. එහි වියදම් ලෙස රු.15,002,995 ක් දරා තිබුණද අදාළ කාර්ය නිම නොවී තිබියදී එම දරන ලද වියදම් හා ලැබීම් වෙනම ව්‍යාපෘති ගිණුමක දැක්වීම් වෙනුවට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම් හේතුවෙන් වර්ෂයේ වියදම් හා ආදායම් එම වටිනාකම් වලින් වැඩියෙන් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය.

(ඈ) මණ්ඩලය විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරනු ලබන කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් යතුරු පැදි 02 ක, මෝටර් රථයක හා සුළු අපනයන බෝග ප්‍රවර්ධන මණ්ඩලයට අයත් මෝටර් රථයක අයිතිය මණ්ඩලය වෙත පවරා ගෙන ඒවා අගය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවිර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් කැඩීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම

හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	නිරීක්ෂණ
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මු.රෙ. 104	2018 වර්ෂයේ අනුරාධපුර උසුල්දෙණිය ගබඩාවේ රු. 4,094,596 ක් වටිනා සෝයා බෝංචි කි.ග්‍රෑ. 37,223 ක් අස්ථානගත වීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ii) මු.රෙ. 571	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෞද්ගලික සැපයුම්කරුවන් 30 දෙනෙකුගෙන් ලැබී තිබුණු වර්ෂ 02 ක ඉක්මවූ රු. 78,472,024 ක තැන්පතු අදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2022 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 වගන්තිය	2018, 2019, 2020 හා 2021 වර්ෂවල වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2017 සහ 2018 වර්ෂවලදී 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ දක්වා ඇති අරමුණක් නොවූ වැව්වල පස් ඉවත් කර අධිවේගී මාර්ගවලට විකිණීමේ කටයුතු කිරීම වෙනුවෙන් රු. 3,370,595 ක වියදමක් දරා එම පස් විකිණීමෙන් රු. 81,134,631 ක ආදායමක් ලබා තිබුණි. වැව් ව්‍යාපෘති වාර්තාවට අනුව සපයන ලද පස් සඳහා අදාළ ගොවි සංවිධානවලින් මණ්ඩලයට මුදල් ලබාගෙන එම මුදල් රජයේ ප්‍රතිපාදනද සමඟ යොදා කුඩා වැව් නිසි ප්‍රමිතියට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපදේශකත්වය යටතේ

සංවර්ධනය කළ යුතු බව දක්වා තිබුණත් එසේ නොකර රු. 77,764,036 ක් ස්ථාවර තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී තණමල්විල ගොවිපොළෙහි ඇති සාගිනි වැව ප්‍රතිසංස්කරණයේ කොටසක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදුකර තිබුණු අතර ඉතිරි වැඩ කොටස් සඳහා රු.1,597,201 ක් සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය විසින් ගෙවීමට එකඟතාවය පලකර ඒ සඳහා රු. 500,000 ක අත්තිකාරම් මුදලක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබාදී ඇතත් වැවේ ඉතිරි කාර්යයන් නිසිපරිදි නිමකර ගොවිපොළෙහි වගාවන් සඳහා ජලය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) **තණමල්විල ගොවිපොළ**

(i) 2020 වර්ෂයේදී රු. 600,000 ක් වැයකර කාබනික පොහොර සැකසීමේ ගොඩනැගිල්ල ඉදි කර ප්‍රයෝජනයට නොගෙන එය නිෂ්කාර්යව තිබියදී සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි කාබනික පොහොර මෙට්‍රික් ටොන් 329 ක් නිෂ්පාදනය හා තවත් කාබනික පොහොර ඒකකයක් පිහිටුවීම සඳහා රු.3,950,000 ක් වෙන්කර ඇතත් එම කිසිදු කටයුත්තක් සිදු කර නොතිබුණි.

(ii) පසුගිය සහ සමාලෝචිත වර්ෂ වල ක්‍රියාකාරී සැලැස්මේ ජාතික බීජ නිෂ්පාදනයට සහය වීම සඳහා එම ගොවිපොළ යොදාගැනීම වෙනුවෙන් පිළිවෙළින් රු.500,000 ක් සහ රු. 1,000,000 ක් වෙන්කර තිබුණද එම කාර්යය සිදුකර නොතිබුණි.

(ආ) බුත්තල ගොවිපොළ

(i) පෞද්ගලික ආයෝජකයෙකුට බුත්තල ගොවිපොළෙහි 2021 අප්‍රේල් 05 දින සිට මණ්ඩලයේ නාමය භාවිතා කරමින් කාබනික පොහොර නිෂ්පාදනය කර බෙදාහැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ඉඩකඩ ලබාදී තිබුණි. එහි නිෂ්පාදන සාම්පල් පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් පර්යේෂණ ආයතනයක් වන නිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් ඉදිරිපත් කළ විශ්ලේෂණ වාර්තාව අනුව ඒවා ප්‍රමිතියෙන් ඉතා අවම මට්ටමක පවතින බව දන්වා තිබියදීත් ප්‍රමිතිය පිළිබඳ නොසලකා සමාලෝචිත වර්ෂයේදී කාබනික පොහොර හා බඳුන් මිශ්‍රණ කිලෝ ග්‍රෑම් 166,500 ක් මණ්ඩලයේ නාමය යටතේ අලෙවි කර තිබුණි.

(ii) මණ්ඩලය විසින් බීජ කහ ඉල්ලුම සපුරාලීම සඳහා දායකත්වය දැක්වීම අරමුණු කරගෙන බුත්තල ගොවිපොළෙහි අක්කර 2.5 ක බීජ කහ කිලෝ ග්‍රෑම් 2,500 ක් වගා කර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 1,345,544 ක් සහ පසුගිය වර්ෂයේදී රු. 2,104,383 ක් ලෙස එකතුව රු. 3,449,927 ක් වැයකර තිබුණි. නිෂ්පාදනයෙන් අපේක්ෂිත කහ අස්වැන්න කිලෝ ග්‍රෑම් 15,167 වුවත් සත්‍ය අස්වැන්න කිලෝ ග්‍රෑම් 1,710 ක් ලෙස අපේක්ෂිත ඵලදාව සියයට 89 කින් අඩුවී තිබුණි. 2023 මාර්තු 24 දින දක්වා එම කහ තොගය අලෙවි කිරීමට පියවර ගෙන නොතිබුණි. කහ වගාව වෙනුවෙන් මණ්ඩලය දරන ලද සම්පූර්ණ මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේ රු.16,020,225 ක ශුද්ධ ලාභය සඳහා සෘජුවම රු. 26,392,996 ක ස්ථාවර තැන්පතු පොලී ආදායම දායක වී ඇති අතර මණ්ඩලය විසින් සිදුකරන අනෙකුත් ව්‍යාපෘති සතුටුදායක නොවන කාර්යසාධන මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පැළ තවාන්, සාම්ප්‍රදායික සහල් අලෙවි ව්‍යාපෘතිය හා ගොවිපොළවල කටයුතු වැනි ව්‍යාපෘති 13 කින් ව්‍යාපෘති 09 ක් ශුද්ධ අලාභයන් ලබා තිබුණු අතර එම ව්‍යාපෘති 09 හි ශුද්ධ අලාභය රු. 12,511,507 ක් විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් වල ඇතුළත්ව ඇති රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන සහ පුද්ගලයන්ගෙන් අයවිය යුතු රු. 691,211 ක් වූ ලැබිය යුතු ශේෂ වර්ෂ 08 කට වැඩි කාලයක සිට පැවති අතර ඒවා නිරවුල් කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 62,382 ක් වූ උපචිත වියදම් වර්ෂ 03 කට වැඩි කාලයක සිට පවතින අතර ඒවා නිරවුල් කර නොතිබුණි.

(ඉ) තණමල්විල හා බුත්තල ගොවිපොළ වල අයිනිය වසර 30 ක දිගුකාලීන කල්බදු පදනම් යටතේ මණ්ඩලය වෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ලබාගෙන ඇති බව මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර තිබුණද ඊට අදාළ බලපත්‍ර මණ්ඩලය සතුව නොතිබුණි.

(ඊ) 2012 වර්ෂයේදී නාරාහේන්පිට හෙල්දි පුඩ් භෝජනාගාරයේ සිදු වූ රු. 73,415 ක් වටිනා මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව විමර්ෂණය සිදු කර අලාභ අයකර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ කලංකුට්ටිය සහල් පිටි සැකසුම් එකකයේ කිසිදු නිෂ්පාදන ක්‍රියාවක් සිදුකර නොතිබුණු අතර එහි පැවති යන්ත්‍ර 03 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

ඩබ්ලිව්.ජී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ස්තූතිය පළකිරීම

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය, කඩිනම් කාර්ය වැඩසටහන ක්‍රියාවට නැංවීමේදී ලබා දුන් සහයෝගයට සහ වෙහෙස මහන්සි වී වැඩ කිරීම පිළිබඳව සමස්ත කාර්ය මණ්ඩලයට එහි කෘතඥතාවය පළකර සිටී. ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය සහ කැපවීම නොවන්නට, මෙම වර්ෂයේ සම්පූර්ණ කරන ලද වැඩ කොටස ඉටු කිරීමට කිසිසේත් නොහැකි වන්නට ඉඩ තිබිණි. සියලු කල්හි ලබා දුන් වටිනා සහයෝගය සහ ආධාර වෙනුවෙන් සභාපතිතුමා, උප සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ටද අපගේ කෘතඥතා පූර්වක ස්තූතිය හිමිවේ.

2022 වර්ෂයේ කාර්ය සැලැස්ම සාර්ථකව සම්පූර්ණ කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයට විශිෂ්ට සහයෝගයක් ලබාදුන් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමන්ට, ලේකම්වරයාට, අතිරේක ලේකම්වරුන්ට, ප්‍රධාන ගණකාධිකාරීවරයාට, ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට සහ අමාත්‍යාංශයේ අනෙකුත් කාර්ය මණ්ඩලයට සහ විගණන ඒකකයේ කාර්ය මණ්ඩලයටද ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය සිය ස්තූතිය පළකර සිටියි.